17/04/2011 - බුදුසරණ

**සම්බුද්ධත්ව ජයන්තිය සමග මතුකර ගත යුතු අතීත උරුමයක උල්පත - ගිරිකණ්ඩ චෛත්‍යය හෙවත් ගිරිහඬු මහ සෑය - මිලින්ද මොරගොඩ**

එළැඹෙන වෙසක් පොහොය දිනය සමග 2600 වැනි ශ්‍රී සම්බුද්ධත්ව ජයන්තිය සමරන්නට ශ්‍රී ලාංකික සැදැහැවත් බොදුනුවන් සූදානමින් සිටී. ජන සමාජය පරිවර්තනයකට යොමු කිරීමට බුදු දහම මගින් කළ හැකි බලපෑම පුලුල්ය. බුද්ධ දර්ශනයට වර්තමාන ජගත් ප්‍රජාව වැඩි අවධානයකින් සිටී. කාලීන ජීවිතයට සැනසිල්ල ඇතිකරන යතාර්ථවාදී දර්ශනයක් ලෙස ඔවුහු බුද්ධ ධර්මය අධ්‍යයනය කරති. ජීවිතයේ යථාවබෝධය ළඟා කර ගැනීම ට අනුගමනය කළ යුතු නිවැරදි මග බුද්ධ දේශනාවේ සඳහන්ය. එහි ඇත්තේ සදාකාලික දර්ශනයකි. එයින් ප්‍රඥාව බිහි කරයි.

ත්‍රස්තවාදය අවසන් කිරීම සමග ශ්‍රී ලාංකේය සමාජය හමුවේ ඇත්තේ අලුත් යුගයකි. දැන් දේශයට අවශ්‍යව ඇත්තේ නව දර්ශනයකි. නව මගක් ගොඩනගා ගැනීම ඉදිරියේ සම්බුද්ධත්ව ජයන්තිය වැදගත් සංකේතයකි. අන්තවාදී නොවේ මැදුම් පිළිවෙතකට අනුව රට දියුණු කරන්නට දැන් අවස්ථාව උදා වී තිබේ. ''පිළිවෙතින් පෙළ ගැසෙමු'' යන පාඨය අනුව යමින් නිසි පිළිවෙත් හා හරය කෙරෙහි අවධානය යොමු කිරීම කාලෝචිතය.

සමාජයක් ගොඩ නැගීමේ දී ආගමික නායකත්වය හා ඔවුන් සතු ගෞරවණීය ලක්ෂණ වැදගත්ය. එපමණක් නොවේ. දැය පුබුදුවන හා බොදු බැතිය වඩවන බොදු සංකේත හඳුනා ගැනීම ද යථාවබෝධයකින් කළ යුතු කාර්යයකි. මහා සංඝරත්නය සමාජය නිවැරදි මගට ගැනීම උදෙසා නොයෙකුත් අන්දමින් අනුශාසනා පවත්වති. නමුත් ගිහි සමාජය ජාති, ආගම්, කුළ හා දේශපාලන වශයෙන් කොටස් වලට බෙදී ධනය හා බලය උදෙසා ඉතා විපත්තිදායක අයුරින් ක්‍රියා කරන බව පෙනේ. සමාජය මෙවැනි ව්‍යාකූල තත්ත්වයකට පත්ව ඇති අවස්ථාවක ආගමික නායකයන්ට, සමාජ නායකයන්ට කළ හැකි විශේෂ කාර්ය භාරයක් තිබේ. එනමුත් මෙරට ගිහි සමාජය සේ ම, සංඝ සමාජයත් පසුවන්නේ ඉතා සංකීර්ණ පසුබිමකය. ගිහි සමාජයට මග දක්වන සංඝරත්නය හා විහාරස්ථානය ද නිසි තැන්හි පිහිටුවීම ද අවශ්‍ය භාරයක් බව පෙනේ. ඇතැම් විහාරස්ථාන හා එහි වැඩ වාසය කරන සංඝ රත්නය සතු ක්‍රියාකලාපය බොදුනුවන් කළකිරවන සුළුය. සංඝ සමාජය නිසි මගට ගැනීමට අවශ්‍ය ශාසනික සංශෝධන ගෙන ඒම වැදගත් බව කිහිප අවස්ථාවක දී පෙන්වා දී ඇත. මෑත කාලයේ දී ද සංඝාධිකරණය පිහිටුවීම හා කතිකාවතක් මගින් සංඝ සමාජය නිවැරදි මගට අවතීර්ණ කරගැනීමට අවශ්‍ය යෝජනා ඉදිරිපත් විය. එනමුත් යෝජනා ක්‍රියාත්මක වූයේ නැත. මේ දක්වා ධර්ම සංගායනා දොළහක් පවත්වා ඇති අතර එයින් අවස්ථා තුනක් ශ්‍රී ලංකාවේ දී පවත්වා තිබේ. බුද්ධ දර්ශනය නිවැරදි මගට පත් කිරීමට අවශ්‍ය ශාසනික සංශෝධන ඇති කිරීම කෙරෙහි සියලු දෙනා එකතු වී සාකච්ඡා කළ යුතුය.



ගිරිහඬු සෑය ප්‍රවේශ මාර්ගය ඔස්සේ පෙනෙන අයුරු (ඡායාරූප - නිශාංක සිල්වා)

කාලාන්තරයකට පසු අද බුද්ධ ශාසනය අභියෝගයකට ලක්ව ඇති බව පෙනෙන විටඑවැනි සංශෝධනයක වැදගත්කම පෙනේ. රාජ්‍ය පාලනයට අවවාද අනුශාසනා දෙන මහා බලවේගයක් වන මහා සංඝරත්නය, වර්තමානයේ ගිහි සමාජයේ ඇවතුම් පැවතුම් වෙත නැඹුරු වී තිබේ. ප්‍රායෝගිකව බලන විට දිවයින පුරා පිහිටි විහාරස්ථාන නොයෙකුත් අපහසුතාවන්ට මුහුණ දී ඇති බව පිළිගත යුතුය. ශාසනික පැවැත්ම, විහාරස්ථානයන්හි පවතින අඩුපාඩු සම්බන්ධව ද නොයෙකුත් අදහස් මතුවී ඇත. නගරබද විශාල වශයෙන් සම්පත් ඇති දායක සභා ඇති විහාරස්ථාන හා ඉතා දුර බැහැර දාන වේල සපයා ගැනීමට ද දුෂ්කර විහාරස්ථාන ගැන ද නොයෙකුත් තොරතුරු වාර්තාවෙයි. විහාරස්ථානය වෙනුවට නොයෙක් නම් වලින් හැඳින්වෙන නොයෙක් විහාර කර්මාන්ත ඇති තැන් ප්‍රතිශ්ඨාපනය වී තිබේ. බුද්ධ දේශනාවේ හරය යටපත්වී එහි මතුපිට සරල ආගමික හැඟීම පමණක් ඉදිරියට ගෙන එන ආකාරය ට ධර්ම දේශනා කරන ආකාරය මැනවින් දැකගත හැකිය. සමාජය ගමන් මග සමග ශාසනයේ පිරිහීම හා එහි අවැත දකින අප එහි නිවැරදි මග සොයා ගත යුතුය. ඒ අතරතුර අප විසින් අමතක කර ඇති ශාසනික වැදගත් සංධිස්ථාන විශේෂයෙන් රටට අනාවරණය කළ යුතුය.

ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ, බුද්ධත්වයට පත්වීමට පිටදුන් ජය ශ්‍රී මහා බෝධිය සහ බුදු සිරිපතුල වන්දනාව බොදුනු ජනතාව මහත් ගෞරවයෙන් සළකන බෞද්ධ සංකේතයන්ය. නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පිහිටි ගිරිහඬු සෑය ද මෙවැනි වැදගත්කමකින් යුතු පුද බිමකි. බොදුනු ජනතාවගේ වැඩි අවධානයට ලක්විය යුතු බොදු සංකේතයකි. පැවති ත්‍රස්තවාදී ගැටුම් හෙයින් ජන අවධානයෙන් ගිළිහුණ මෙම පින් බිම අද යළිත් මහජනතාවගේත් ගේ අවධානයට ලක්විය යුතුය.

ගිරිහඬු සෑය බොදුනුවන්ට වැදගත්වන්නේ ඇයි? එය බුදු සිරිතේ වැදගත් සංන්ධිස්ථානයක ජීවමාන සාධකයකි. බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයට පත් අවස්ථාවේ දීම හිමිකර ගත් කේෂ ධාතූන් තැන්පත් කර මෙම ස්ථූපය ඉදිකර ඇති බවට සැලකෙයි. එසේම මෙම ස්ථූපය මෙරට ඇති වූ පළමු වටදාගෙය වශයෙන් ද සැළකිය හැකිය. ශ්‍රී සම්බුද්ධත්වයට පත් බුදුරජාණන් වහන්සේ සත්සතිය අවසානයේ පනස්වන දිනයේ දී වනයට අරක්ගත් දේවතාවියකගේ වචනය පරිදි පැමිණි තපස්සු භල්ලුක වෙළඳ දෙබෑයන් විසින් විළඳ හා මීපැණි ප්‍රථම දනය ලෙස පිළිගන්වන ලද බව පූජාවලියේ සඳහන්ය. දානය පිළිගැනීමෙන් චිත්ත ප්‍රබෝධයට පත් මෙම වෙළඳ දෙබෑයෝ වැඳුම් පිදුම් සඳහා යමක් ඉල්ලා සිටි අවස්ථාවේ බුදු රජාණන් වහන්සේ හිස පිරිමැද කේශධාතූන් වහන්සේලා ලබා දුන් බව ද පූජාවලියේ වැඩිදුරටත් සඳහන්ය.

බුදුරජාණන් වහන්සේ ජීවමාන අවස්ථාවේ දීම පුද සත්කාර ලබන්නට කේෂ ධාතූන් වහන්සේ රැගෙන වෙළඳ දෙබෑයන්ට හිමි වූ දඹදිව උත්තලා නගරයේ සිට සිට පෙරදිග වෙළඳාමට යන අතරතුර ලංකාවට ඔවුහු පැමිණ ඇත. ඔවුහු ගොඩ බැස ඇත්තේ ත්‍රිකුණාමලය වෙළඳ වරායටය. කුච්චවේලිය, කට්ටුකුලම් ප්‍රදේශයේ ගල්වරායෙන් ගොඩබිම සමීපයට පැමිණ යාංඔය ඔස්සේ ගිරිකණ්ඩ පර්වතයට මෙම වෙළඳ දෙබෑයෝ ළඟාවී තිබේ. එහි පිහිටි සුරක්ෂිත තැනෙක බුදුරජාණන් වහන්සේ ජීවමාන අවස්ථාවේ දීම ලැබුණ කේෂධාතූන් තැන්පත් කර සිය ආහාර ගෙන ඇති අතර එය නිම කර පිටත්ව යන්නට සූදානම්වන අවස්ථාවේ දී මෙම කේෂ ධාතු ඉවත් කර ගත නොහැකි වූ බව ත්, එහිම එය නිධන් කොට ගිරිහඬු සෑය ඉදි කළ බවත් ඉතිහාසය ගැන දක්වන මහාචාර්ය එච්. ටී. බස්නායක මහතාගේ ''ගිරිහඬු මහ වෙහෙර පින් බිම තිරියාය'' කෘතියෙහි සඳහන් වෙයි. මෙරට ඉදිවූ පළමු බෞද්ධ සංකේතය ගිරිහඬු මහ වෙහෙර බව සැළකිය හැකි සාධක හමුවී ඇත.

බුදුරජාණන් වහන්සේ ජීවමාන සමයේ දී සිදුවූ මෙම අතිශය වැදගත් සිදුවීමට පසු කළෙක දේවානම් පියතිස්ස රජ සමයේ දී මෙරටට බුදුදහම දායාදයක් ලෙස ලැබිණ. තවත් කාලයක මෙම ශෛලමය පර්වතයේ කටාරම් කොටා බ්‍රාහ්මී ලිපි පිහිටුවා මහ සඟරුවනට පුද කිරීමෙන් මෙම පුද බිමේ දෙවන අදියර ඇරඹී ඇති බවත්, අටවන සියවස වන විට වටදගෙය ඉදිකර ඇති බවත් පුරාවිද්‍යා චක්‍රවර්තී එල්ලාවල මේධානන්ද හිමිපාණෝ සිය අධ්‍යයන වලින් පසු පළ කරන ලද කෘතිවල සඳහන් කරති. ගිරිහඬු සෑය වෙනුවෙන් එම විහාරස්ථානාධිපති ගන්දර ධර්මකීර්ති ශ්‍රී ආනන්ද නායක හිමිපාණන්

රචිත කෘතියක ද මෙම තොරතුරු වැඩිදුරටත් අනාවරණය කර තිබේ. මහනුවර යුගයේ දී රචිත නම් පොත නමැති විහාරස්ථාන නාමාවලිය මෙකී පුද බිම නිතුපත්පාන යනුවෙන් හඳුන්වා ඇත. නිති පතා දැල්වුණ පහනක් තිබෙන ස්ථානය පසුව නිතුපත්පාන යනුවෙන් බිඳී ව්‍යවහාරයට ආ බව විද්වත් මතයයි.



ගිරිහඬු සෑය සමීප දර්ශනයක් (ඡායාරූප - නිශාංක සිල්වා)

කාලාන්තරයක් ඝන වනාන්තරයෙන් වැසී තිබුණ මෙම ඓතිහාසික ස්ථානය 1929 වසරේ දී හමුවූ ලියැවිල්ලක් අනුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව එහි ඉතිහාසය ගවේශනය කර ඇත.  කේෂධාතූන් නිධන් කොට ඉදිකළ ගිරිහඬු සෑය මෙය බව පසුව රජයේ ගැසට් නිවේදනයකින් ස්ථිරව ප්‍රකාශයට පත්කර තිබේ. 1951 වසරේදී මෙම තොරතුරු දැනගැනීමෙන් අනතුරුව එවකට අග්‍රාමාත්‍ය ධුරය හෙබවූ ඩී. එස්. සේනානායක මැතිතුමා එවකට පුරාවිද්‍යා අධිකාරී ධුරය හෙබවූ මහාචාර්ය සෙනරත් පරණවිතාන ශූරීන් ලවා තිරියායේ පුරා විද්‍යා කඳවුරක් ඇති කර බොදුනුවන්ගේ අවධානයට ලක් විය යුතු මෙම වැදගත් සිද්ධස්ථානය ප්‍රතිසංස්කරණය කර ඇත. එයින් වටදා ගෙය හෙළි පෙහෙළි කර මතු කරගෙන තිබේ.

ගිරිහඬු සෑය පිහිටා ඇත්තේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ යාංඔය මුහුදට ගලා බසින ස්ථානය සමීපයේය. ත්‍රිකුණාමලයට සැතපුම් තිහක් පමණ උතුරින් පිහිටි තිරියාය  ගම පිහිටා ඇති අතර එකී ගම්මානයට සැතපුමක් පමණ බටහිර ට වන්නට කුඩා පර්වතයක් මුදුනේ මෙම පින්බිම පිහිටා ඇත. දෙවැනි සියවසේ දී වසභ රජතුමන් නීත්තුපාන නමින් වැවක් කරවා ඇති බවත් අටවැනි සියවස වන විට බෞද්ධ විහාරයක් පැවති බවට සාධක ද හමුවී  ඇත. කඳු මුදුනේ පිහිටි ගල්ලෙන් වල බ්‍රාහ්මී අක්ෂර ආකාරයේ ලියැවිලි හඳුනාගෙන තිබේ. සංස්කෘත භාෂාවෙන් ලියැවී ඇති සෙල් ලිපියක මෙම චෛත්‍යය වන්දනා කිරීමට ගාථා ගී දහයක් කියවා ගන්නට හැකිවීය. ඓතිහාසික වැදගත්කමක් ඇති මෙම පුදබිම 1985 න් පසුව ත්‍රස්තවාදී ගැටුම් නිසා විනාශ වී ජනශූන්‍ය වූ අතර මෙහි විහාරස්ථානයේ වැඩ විසූ ගන්දර ධර්මකීර්තී ශ්‍රී ආනන්ද නායක හිමිපාණන් ද ස්වකීය දිවි ගලවාගෙන ඇත්තේ පළා ගොස් සැඟවී ජීවත්වීමෙන්ය. 2005 වසරින් පසු ගැටුම් තවත් උත්සන්න වූ හෙයින් පූජණීය ගිරිහඬු සෑය විහාරස්ථානය හුදෙකලා විය. බොදු බැතිමතුන්ට එහි ළඟාවිය නොහැකි වී ඇත. පසුව නාවික හමුදාව විසින් මෙම භූමිය අත්පත් කරගෙන තිබේ. ත්‍රිවිධ හමුදාව මෙවැනි සිද්ධස්ථාන ආරක්ෂා කර එහි අතීත වැදගත්කම නැවත මහජනතාවට දැක බලා ගන්නට සැලැස්වීම වැදගත් කාර්යයකි.

වසර තිහක් පැවති යුද්ධය නිසා අන්ධකාරයෙන් වැසී තිබුණ ගිරිගඬු සෑ පුදබිම යළි බොදු දනන්නට විවෘතය. ගැටුම් අවසන් වීමත් සමග දැන නැවතත් තිරියායට වන්දනාවේ යන බොදුනු දනන්ගේ බැති බර වන්දනාවට ගිරිහඬු සෑය එකතුවී තිබේ.

විවිධ යුග වලදී බෞද්ධාගමේ පැවැත්මට ඇති වූ තර්ජන හා නොසලකා හැරීම් නිසා වටිනාකම්ක් සහිත ස්ථාන අනවධානයට ලක්ව තිබීම කණගාටුවට කරුණකි. රට පුරා එවැනි වැදගත් සංකේත හඳුනාගෙන ඒවා මතු පරපුර වෙනුවෙන් විශේෂ සංරක්ෂිත වැඩි පිලිවෙලක් ඇරඹීම අපගේ යුතුකමෙකි. ගිරිහඬු සෑය සම්බන්ධයෙන් නොයෙකුත් පුරා විද්‍යා පර්යේෂණ පවත්වා ඇති අතර ඒ අවටින් හමුවූ ශිලා ලේඛන කියැවීමෙන් මෙරට ඉතිහාසය හා බැඳුණු විශිෂ්ඨ අනන්‍යතා හඳුනා ගන්නට විද්වතුන් සමත්ව ඇත. අභාග්‍යය වී ඇත්තේ බුදු රජාණන් වහන්සේ ගේ කේෂ ධාතූන් නිධන් වූ බවට සැලකෙන මෙම බොදු බිම නිසි වැදගත් බුහුමනට ලක් නොවීමයි.

මෙම පුදබිම යළි බොදු බැතිමතුන්ට පහසුකම් සහිත ස්ථානයක් කරන්නට අවශ්‍යය.  සාමාන්‍යයෙන් මෙවැනි තැන් රැක බලා ගැනීම පැවරෙන්නේ රජයටය. එහෙත් එහි වගකීම රජයට පමණක් පැවරීම සුදුසු නැත. රජයට එය බරකි. රජයේ වියදම පැවරෙන්නේ මහජනතාවගේ බදු බරටය. රජයේ වියදමෙන් තොරව සාර්ථක අන්දමට බොදු සිද්ධස්ථාන පවත්වාගෙන යන බව අපට පෙනෙන කාරණයකි. රාජ්‍ය අනුබලය ඇතිව සමාජයේ පිළිගැනීම අනුව පිහිටුවන ලද විශේෂ කමිටුවක් හෝ භාරකාර අරමුදලක් මගින් වැඩි අවධානයකින් හා නිසි සැලැස්මකින් යුතුව මෙම විශේෂ පුණ්‍ය භූමිය යළි පුනර්ජීවනයකට ලක් කළ හැකිය.  සම්බුද්ධත්ව ජයන්තිය සමරන අවස්ථාවේ දී ශාසනික සංශෝධන කෙරෙහි අවධානය යොමු කරන අතර ගිරිහඬු සෑය වැනි දීර්ඝ ඉතිහාසයක් ඇති, මෙරට බොදුනුවන්ට වැදගත් ආගමික සිද්ධස්ථානයක් නගා සිටුවීමට බොදුනුවන් එකතුවීම අවශ්‍යය.